# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2027/4 - 2017 ජූලි මස 10 වැනි සඳුදා - 2017.07.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

**බෝධිරාජාරාම අධ්‍යාපනික හා සංස්කෘතික පදනම නීතිගත සංස්ථාව**

2014 අංක 28 දරන බෝධිරාජාරාම අධ්‍යාපනික හා සංස්කෘතික පදනම සංස්ථාගත කිරීමේ පනතේ 7(1) වගන්තිය යටතේ සකස් කරන ලද සංස්ථාවේ රීති (Rules) පනතේ 7(4) වගන්තිය අනුව ප්‍රසිද්ධ කිරීම

2014 අංක 28 දරන බෝධිරාජාරාම අධ්‍යාපනික හා සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීම) පනතේ අංක 7(1) වගන්තිය අනුව එකී සංස්ථාවේ 2015.05.18 දින පවත්වන ලද සාමාජිකයින්ගේ මහාසභා රැස්වීමේදී සාදා අනුමත කරන ලද රීති මාලාව මෙහි පහත දැක්වෙන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

(2014 අංක 28 දරන බෝධිරාජාරාම අධ්‍යාපනික හා සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ)පනත මගින් සංස්ථාගත කර ඇත)

Rules made by its members at the General Meeting held on 18th May 2015

2015 මැයි මස 18 වන දින සාමාජිකයින්ගේ මහසභා රැස්වීමේ දී සම්මත කරගන්නා ලද රීති

''බෝධිරාජාරාම අධ්‍යාපනික හා සංස්කෘතික පදනම'' නීතිගත සංස්ථාව

(ස්වේච්ඡා සමාජසේවා සංවිධානයකි)

**රීති මාලාව (Rules)**

01. මෙම සංස්ථාව(1) ''2014 අංක 28 දරන බෝධිරාජාරාම අධ්‍යාපනික හා සංස්කෘතික පදනම (සංස්ථාගත කිරීමේ) පනත'' සහ (2) ''1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජසේවා සංවිධාන (ලියාපදිංචි කිරීම සහ අධීක්ෂණය කිරීමේ) පනත'' යන පනත්වල ඇතුලත් සීමාවන් වලට අනුගතව කටයුතු කරනු ලබන්නේය.

02. (අ) බෝධිරාජාරාම අධ්‍යාපනික හා සංස්කෘතික පදනම නීතිගත සංස්ථාව, එකී සංස්ථාවේ සාමාජිකයින්ගෙන් සමන්විත වන්නේය.

(ආ) සංස්ථාවේ සාමාජිකයින් ලාභ අපේක්ෂාවෙන් කටයුතු නොකරන්නේය.

03. සංස්ථාව ජාතිය, ආගම, භාෂාව, කුළය, ගැහැණු පිරිමි බව, දේශපාලන මතය, උපන් ස්ථානය හෝ වෙනත් එවැනි කරුණු නොසලකා සංස්ථාවේ අරමුණු ක්‍රියාත්මක කරනු ලබන්නේය.

1A - PG 3600 — 107 (2017/07)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**සාමාජිකත්වය**

4 (අ) සංස්ථාවේ සියලු සාමාජිකයින් පනතේ සඳහන් සමාජසේවා අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස කටයුතු කරන්නේය.

(ආ) සංස්ථාවේ සියලු සාමාජිකයින් සමාජ සේවය සැලසීම/ සමාජ සේවයේ යෙදීම අරමුණු කරගත්/ සමාජ සේවයට හිතැති තැනැත්තන් වන්නේය.

(ඇ) ඉහත (අ) සහ (ආ) හි කියවෙන සුදුසුකම් සපුරාලන තැනැත්තන් මතු සඳහන් වන සාමාජිකත්ව වර්ග යටතේ ක්‍රියාකාරී සභාවේ නිර්දේශය සහිතව මහ සභා රැස්වීමේදී සාමාජිකයින් ලෙස ඇතුලත් කරගනු ලබන්නේය.

(ඈ) සංස්ථාව විසින් සංස්ථාවේ සාමාජිකයන්ගේ නාම ලේඛනයක් පවත්වාගනු ලබන්නේය.

5. සාමාජිකත්වය වර්ග කිරීම

i. *ප්‍රධාන සාමාජික*
සංස්ථාවේ නිර්මාතෘවරයා සහ ප්‍රථම සාමාජිකයා පූජ්‍ය උඩවතැන්නේ සුමන මහා ස්ථවිරයන් වහන්සේය.

ii. *ආරම්භක සාමාජිකයන්*
සංස්ථාවේ සංස්ථාපනය කිරීමට දායකවූ සාමාජිකයන් ආරම්භක සාමාජිකයන් වන්නේය.

iii. *ගරු සාමාජිකයන්*
සංස්ථාවේ කටයුතු සඳහා සහාය ලබාදිය හැකි පිළිගත් පුද්ගලයන්ට සහ සංවිධානයන්ට ක්‍රියාකාරී සභාවේ නිර්දේශය සහිතව මහසභා රැස්වීමකදී ගරු සාමාජිකත්වය පවරනු ලැබිය හැකි අතර එලෙස සාමාජිත්වය ලබන සාමාජිකයෝ ගරු සාමාජිකයන් වේ. ගරු සාමාජිකයන් මහාසභා රැස්වීමකදී ඡන්දය භාවිතා කිරීමට අයිතිය නොමැත්තේය.

vi. *යාවජීව සාමාජිකයන්*
ක්‍රියාකාරී සභාවේ නිර්දේශය සහිතව මහසභා රැස්වීමකදී ආරම්භක සාමාජිකයන් හෝ සංවිධාන හෝ ඒවායේ සාමාජිකයන්ට යාවජීව සාමාජිකත්වය ලබා දිය හැකිය. එලෙස යාවජීව සාමාජිකත්වය ලබන සාමාජිකයෝ යාවජීව සාමාජිකයන් වේ.

v. *අනුබද්ධ සංවිධාන සාමාජිකයන්*
සංස්ථාවේ පොදු පරමාර්ථ ඉටුකරගනුවස් සංස්ථාව විසින් අනුබද්ධ සංවිධාන ගොඩනංවා ක්‍රියාත්මක කරනු ලබන අතර සංස්ථාව යටතේ එලෙස පිහිටුවනු ලබන අනුබද්ධ වෘත්තීමය සංවිධාන සඳහා මහ සභාවේ එක සාමාජිකත්වය බැගින් හිමි වන්නේය. මහාසභා රැස්වීමකදී ඔවුනට ඡන්දය භාවිතා කල නොහැකිය.

6. සාමාජිකත්වය අපේක්ෂා කරන සංවිධාන හෝ පුද්ගලයන් සාමාජිකත්ව අයදුම් කිරීම විධිමත් සාමාජික අයදුම්පතක් මගින් ඉදිරිපත් කිරීම මගින් කළ යුතුවේ. ඊට ක්‍රියාකාරී සභාවේ නිර්දේශ මත මහසභා රැස්වීමකදී සාමාජිකත්වය ලබාදීම අනුමත වුවහොත් සාමාජික ගාස්තු ගෙවා සාමාජිකත්වය ලබාගත හැකිය.

7. වාර්ෂික සාමාජිකත්ව ගාස්තුව රු. 1000ක් ද අනුබද්ධ සංවිධාන සඳහා රු. 5000ක් ද වේ. සාමාජිකත්ව අහෝසි වීමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් සාමාජිකත්ව ගාස්තු ආපසු ගෙවනු නොලැබේ.

8. සාමාජිකත්වය අහෝසි කිරීම

(අ) සාමාජිකයෙකුගේ මරණයෙන් හෝ ඉල්ලා අස්විමෙන් හෝ

(ආ) සංස්ථාවේ නීති රීති වලට පටහැනිව කටයුතු කිරීම අනුව සභාපතිගේ හා ක්‍රියාකාරී සභාවේ තීරණය පරිදි සාමාජිකත්වය අහෝසි කර මහ සභාවේ එම තීරණ සම්මතයෙන් හෝ

(ඇ) මානසික වියවුල් තත්වයකින් පෙළීම හෝ සංස්ථාවේ අරමුණු වලට පටහැනිව කටයුතු කිරීම අනුව සාමාජිකයෙකුගේ සාමාජිකත්වය ක්‍රියාකාරී සභාවේ නිර්දේශය සහිතව මහසභා රැස්වීමකදී සාමාජිකත්වය අහෝසි කර සාමාජිකත්වය ඉවත්කරනු ලැබීමෙන් සාමාජිකත්වය අහෝසි වන්නේය.

**සංවිධාන ව්‍යුහය**

09. *සභාපති* සංස්ථාවේ නිර්මාතෘවරයා සහ ප්‍රථම සාමාජිකයා *පූජ්‍ය උඩවතැන්නේ සුමන මහා ස්ථවිරයන් වහන්සේ* බව පිළිගනු ලබන්නේය.

10. සංස්ථාවේ නිර්මාතෘවරයා/ සහ ප්‍රථම සාමාජිකයා (සභාපති) වන *පූජ්‍ය උඩවතැන්නේ සුමන මහා ස්ථවිරපාදයන් වහන්සේගේ* සභාපතීත්වය *යාවජීව* වන්නේය.

11. *සැමවිටම පූජ්‍ය ඌවතැන්නේ සුමන මහා ස්ථවිරපාදයන් වහන්සේගේ අනුශාසකත්වයට ප්‍රමුඛස්ථානය ලැබෙන්නේය.*

12. *ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සභාපති*
ක්‍රියාකාරී සභාව සඳහා මහා සභාවෙන් තෝරාපත් කරනු ලබන උපසභාපතිවරයෙකු සභාපතිගේ නිර්දේශය මත ක්‍රියාකාරී සභාවේ ජ්‍යෙෂ්ඨ උපසභාපති ලෙස පත් කළ හැකිය.

13. *නියෝජ්‍ය සභාපති*
උපසභාපති තනතුර සඳහා මහා සභාවේදී සාමාජිකයෙක් තෝරා පත්කර ගත යුත්තේය.

14. මහ ලේකම්
ලේකම් තනතුර සඳහා මහා සභාවේදී සාමාජිකයෙකු තෝරා පත්කර ගත යුතුය. ඔහු ක්‍රියාකාරී සභාවේ ලේකම් ද වන්නේය. සාමාජික ලේඛනය පවත්වාගෙන යෑම, එය යාවත්කාලීන කිරීම, මහාසභා රැස්වීම් කැඳවීම සහ ක්‍රියාකාරී සභා රැස්වීම් කැඳවීම, මහාසභා රැස්වීම් වාර්ථා සහ ක්‍රියාකාරී සභා රැස්වීම් වාර්ථා සකස් කිරීම, අදාල වාර්ථා මහාසභා සහ ක්‍රියාකාරී සභා වෙත ඉදිරිපත් කිරීම ලේකම් විසින් කළයුතු වන්නේය.

15. *නියෝජ්‍ය මහ ලේකම් සහ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ මහ ලේකම්*
නියෝජ්‍ය ලේකම් සහ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ මහ ලේකම් තනතුර සඳහා මහා සභාවේදී සාමාජිකයෙකු තෝරා පත්කර ගත යුතුය. ඔහු මහ ලේකම්ගේ කාර්භාරයට සහය විය යුතු වන්නේය. මහ ලේකම් නියෝජනය කළ යුතු වන්නේය. ජාත්‍යන්තර කටයුතු වලදී සියලු සම්බන්ධීකරණ කටයුතු කළ යුතු වන්නේය.

16. *භාණ්ඩාගාරික*
පදනමේ වත්කම් ලියවිලි භාණ්ඩාගාරික භාරයේ තබාගත යුතුය. වාර්ෂික ගිණුම් මහා සභාව වෙත ඉදිරිපත් කිරීම කළ යුතුය. පදනමේ බැංකු ගිණුම් පවත්වාගෙන යෑම සහ කාර්ය මණ්ඩලය වෙතින් සහ ගණකාධිකාරී වෙතින් කාර්යයන් ඉටුකරවීම සහ විගණන කටයුතු අධීක්ෂණය කළයුතු වන්නේය.

17. *නීති උපදේශක*
පදනමේ නෛතික කටයුතු සඳහා උපදෙස් සැපයීම කළයුතු වන්නේය.

**ක්‍රියාකාරී සභාව හෙවත් පාලක සභාව**

18. ක්‍රියාකාරී සභාව හෙවත් පාලක සභාව -
සංස්ථාව කලමනාකරණය කිරීම, පාලනය කිරීම ක්‍රියාකාරී සභාව සතු වන අතර අරමුදල් පාලනය කිරීමද ක්‍රියාකාරී සභාව විසින් කළ යුතුය. ක්‍රියාකාරී සභාව සභාපති, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සභාපති, නියෝජ්‍ය සභාපති, මහ ලේකම්, නියෝජ්‍ය මහ ලේකම් සහ ජාත්‍යන්තර කටයුතු පිළිබඳ මහ ලේකම්, ලේකම්, භාණ්ඩාගාරික, නීති උපදේශක, ඇතුළු සාමාජිකයන් හත් දෙනෙකුගෙන් සමන්විත වන්නේය. ක්‍රියාකාරී සභාවේ ප්‍රධානී සංස්ථාවේ සභාපති වන්නේය.

19. ක්‍රියාකාරී සභාවේ ධූරකාලය අවුරුදු තුනකට සීමා වන්නේය.

20. ධූරකාලය අවසන් වූ සභිකයෙකුට හා ක්‍රියාකාරී සභාවේ සාමාජිකයෙකුට නැවත පත්වීමට සුදුසුකම් ඇත්තේය.

21. කාරක සභාව සඳහා කාන්තා නියෝජිතයන් අවම වශයෙන් 02 ක් වත් පත් විය යුතුය.

22. සංස්ථාවේ සහ ක්‍රියාකාරී සභාවේ සාමාජිකයෙකු සිය ධූර කාලය සම්පූර්ණ කිරීමට ප්‍රථම විනය විරෝධී හේතු මත ඉවත් කිරීමට අවශ්‍ය වුවහොත් පරිපාලන/විනයපාලන සහ සුභ සාධන අනු කමිටුවේ නිර්දේශ මත ක්‍රියාකාරී සභාවේ අභිමතයයෙන් එය සිදුකළ හැකි වන්නේය.

23. (අ) ක්‍රියාකාරී සභාව පත්කිරීමෙන් පසු කාරක සභිකයෙකු පනතේ 5 (3) (අ) හි සඳහන් ආකාරයට ඉවත් වුවහොත් ඒ වෙනුවට වෙනත් තැනැත්තෙකු පත්කළ යුත්තේය.
(ආ) එම තැනැත්තාගේ ධූරය ශේෂව පවතින කාලය සඳහා පමණක් වලංගු වන්නේය.

24. ක්‍රියාකාරී සභාවට ඇතුලත් වියයුතු සාමාජික සංඛ්‍යාව සංශෝධනය කිරීමක් සිදුවන්නේ නම් එය මහ සභා රැස්වීමේ දී තීරණය කරනු ලබන්නේය.

25. සංස්ථාවේ අරමුණු, ක්‍රියාකාරකම්වලට අදාලවන සියලු තීරණ ගැනීම ක්‍රියාකාරී සභාව විසින් කරනු ලබන්නේය.

26. සංස්ථාවේ තීරණ ගැනීමට හා ක්‍රියාත්මක කිරීම පිණිස සෑම විටම ක්‍රියාකාරී සභාව රැස්වන්නේය.

27. ක්‍රියාකාරී සභාවේ ගන්නා සියලු තීරණ අනුමත වූවා සේ සැලකෙන්නේ ක්‍රියාකාරී සභාවේ සභාපතිවරයා විසින් එය අනුමත කිරීමෙන් පසුවය.

28. ක්‍රියාකාරී සභාව විසින් ගන්නා තීරණ අනුමත කිරීම හෝ නිශේධ කිරීමේ බලය ක්‍රියාකාරී සභාවේ සභාපතිවරයා සතු වන්නේය.

29. ක්‍රියාකාරී සභාවට තමුන්ගේ බලතල කිසියම් පාර්ශ්වයකට පැවරීම ඉවත් කිරීම කළ හැකි වන්නේය.

30. සභාව විසින් නිර්දේශ කරනු ලබන යෝජනා ක්‍රියාකාරී සභාව විසින් සලකා බැලීමෙන් පසු අවශ්‍ය නම් සුදුසු සංශෝධන සහිතව අනුමැතිය පිණිස ක්‍රියාකාරී සභාවේ සභාපති වරයා වෙත ඉදිරිපත් කරනු ලබන්නේය.

31. සංස්ථාවේ කටයුතු කරගෙන යාම සඳහා කාර්යාලයක් ක්‍රියාකාරී සභාව විසින් පවත්වාගෙන යනු ලබන්නේය.

32. සංස්ථාවේ කටයුතු කරගෙන යාම පිණිස ක්‍රියාකාරී සභාව විසින් වැටුප් ලබන ප්‍රධාන විධායක නිළධාරි වරයෙකු සහ කාර්ය මණ්ඩලයක් ද, පත්කරනු ලබන්නේය.

33. ක්‍රියාකාරී සභාව විසින් සංස්ථාවේ කටයුතු කරගෙන යාම සහ ක්‍රියාකාරී සභාවේ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම පිණිස ප්‍රධාන විධායක නිළධාරි සහ කාර්ය මණ්ඩලය විසින් අනුගමනය කලයුතු කාර්ය සංග්‍රහයක් සකස්කර ක්‍රියාත්මක කරනු ලබන්නේය.

34. පනතේ 6 (ඊ) හි සඳහන් ආකාරයට කාර්ය මණ්ඩලයට බඳවා ගැනීමට අදාලවන සියලු නිර්ණායකයන්, සේවක සංයුතිය සහ බඳවාගැනීමේ පටිපාටිය ක්‍රියාකාරී සභාව විසින් තීරණය කරනු ලබන්නේය.

35. පනතේ 6 වගන්තියේ සඳහන් සංස්ථාවේ සියලු කටයුතු පරිපාලනය හා කළමනාකරණය ක්‍රියාකාරී සභාව විසින් කරනු ලබන්නේය.

36. කාර්ය මණ්ඩලය සහ කාර්යාලය පවත්වාගෙන යාම පිණිස අවශ්‍යවන මුදල් ක්‍රියාකාරී සභාව විසින් පදනමේ අරමුදලින් වැය කරන්නේය.

37. සංස්ථා සභාපතිගේ වියෝවීමකදී හෝ මරණයෙන් හිස්වන සභාපති ධූරය සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සභාපති වරයා පත්විය යුත්තේය. එසේ පත්වන සභාපති විසින් ක්‍රියාකාරී සභාව මෙහෙයවනු ලබන්නේය. එම තැනැත්තාගේ සභාපති ධූරයකාලය ශේෂව පවතින කාලය සඳහා පමණක් වලංගු වන්නේය. මහසභා රැස්වීමේදී එම තැනැත්තාට සභාපතිධූරය සඳහා සාමාජිකයින්ගේ කැමැත්ත මත නැවත පත්විය හැක්කේය

අනු කමිටු

38. (අ) ක්‍රියාකාරී සභාව විසින් කලමනාකරණ අවශ්‍යතා මත පහත සඳහන් අනු කමිටු සඳහා මහා සභාවේ සභිකයින් අනු කමිටු සාමාජිකයන් ලෙස පත්කළ හැකි වන්නේය

1 මුදල් හා මුදල් රැස්කිරීමේ කමිටුව
2 කළමනාකරණ හා විගණන කමිටුව
3 පරිපාලන/විනයපාලන සහ සුභ සාධන කමිටුව
4 අධ්‍යාපන /පුහුණු කිරීම්/ජාත්‍යන්තර සම්බන්ධතා සහ විශේෂ කටයුතු කමිටුව
5 ප්‍රචාරණ/මාධ්‍ය කටයුතු/අනුග්‍රහක කමිටුව

(ආ) එක් අනු කමිටුවක් සාමාජිකයන් 5 දෙනෙකුගෙන් සමන්විත වන්නේය. අනු කමිටුවක් සඳහා ගරු සාමාජිකයන් හැර ඕනෑම සාමාජිකයෙකුට පත්විය හැක්කේය.

අනුබද්ධ සංවිධාන

39. පනතේ 3(1) යටතේ සංස්ථාව සංස්ථාපනය කරනු ලැබූ පොදු පරමාර්ථ ඉටුකරගනු වස් සංස්ථාව විසින් අනුබද්ධ සංවිධාන ගොඩනංවා ක්‍රියාත්මක කරනු ලබන්නේය.

40. සංස්ථාව විසින් ක්‍රියාත්මක කරනු ලබන පහත සඳහන් වෘත්තීය සංවිධාන අනුබද්ධ සංවිධාන ලෙස පිළිගනු ලබන්නේය.

දේශමාමක ජාතික බලවේගය
දේශමාමක ජංගම වෙළෙඳුන්ගේ ජාතික සංවිධානය
දේශමාමක පදික වෙළෙඳුන්ගේ ජාතික සංවිධානය
දේශමාමක ත්‍රි රෝද රථ කර්මාන්තකරුවන්ගේ ජාතික සංවිධානය
දේශමාමක රියදුරු හා කොන්දොස්තරවරුන්ගේ ජාතික සංවිධානය
දේශමාමක බස් රථ හිමිකරුවන්ගේ ජාතික සංවිධානය
දේශමාමක දිරිය කාන්තා ජාතික සංවිධානය
දේශමාමක පාරිසරික අධ්‍යයන කේන්ද්‍රය
දේශමාමක ආධුනික කලාකරුවන්ගේ සංසදය
දේශමාමක තුරුණු සවිය
දේශමාමක සුලු හා මධ්‍ය නිර්මාණ ව්‍යාපාරික සංසදය

41. පනතේ 3(1) යටතේ සංස්ථාව සංස්ථාපනය කරනු ලැබූ පොදු පරමාර්ථ ඉටුකරගනු වස් සංස්ථාව විසින් හවුල්කාර සංවිධාන ගොඩ නැංවීම සහ බඳවා ගැනීම ක්‍රියාත්මක කරනු ලබන්නේය.

**සංස්ථාවේ අරමුදල**

42. පනතේ 9.(1) වගන්තිය යටතේ සංස්ථාව අරමුදලක් පවත්වාගෙන යනු ලබන්නේය.

43. (අ) සංස්ථාව වෙනුවෙන් ක්‍රියාකාරී සභාව විසින් අරමුදල් රැස්කර ගනු ලබන්නේය. එසේ රැස්කරනු ලබන සියළු ආකාරයේ මුදල් හා පරිත්‍යාග සංස්ථා අරමුදල වන්නේය.

(ආ) අරමුදල් සම්පාදනය කරගැනීම පහත සඳහන් පරිදි

* සාමාජික ගාස්තු, ග්‍රාහක මුදල්, දායක මුදල්, ගාස්තු හෝ පරිත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් ලැබෙන මුදල්
* සංස්ථාවේ ආයෝජන මත ආදායම්
* දේශිය සහ ජාත්‍යන්තර ආධාර
* රාජ්‍ය ප්‍රතිපාදන
* දේශිය සහ විදේශීය ණය
* ක්ෂුද්‍ර මූල්‍ය තැන්පතු අරමුදල

ආදි මූලාශ්‍රයන් සම්පාදනය කරගත හැකි වන්නේය

**මූල්‍ය කළමනාකරණය**

44. (අ) සංස්ථා අරමුදල පරිපාලනය සඳහා ක්‍රියාකාරී සභාවේ ප්‍රධානී සහ ක්‍රියාකාරී සභාව විසින් සිදුකළ යුතු වන්නේය.
(ආ) සංස්ථාව වෙනුවෙන් රැස්කරගනු ලබන සියලුම මුදල් සංස්ථා අරමුදලට බැරකර පිළිගත් බැංකුවල පදනම නමින් පවත්වාගෙන යන ගිණුම්වල තැන්පත් කරනු ලබන්නේය.
(ඇ) සංස්ථාව නමින් පවත්වාගෙන යන බැංකු ගිණුම් ආරම්භ කිරීම, ගිණුම් වසා දැමීම සහ ගිණුම්ගත මුදල් හුවමාරු කිරීම ක්‍රියාකාරී සභාවේ ප්‍රධානී සහ ක්‍රියාකාරී සභාව විසින් හෝ ක්‍රියාකාරී සභාවේ පූර්ව අනුමැතිය මත සිදුකළ යුතු වන්නේය.
(ඈ) සංස්ථාවේ අරමුදල් සංස්ථාවේ අරමුණු සාක්ෂාත් කරගැනීම පිණිස පනතේ 6 වගන්තියේ සඳහන් කාර්යයන් සඳහා ක්‍රියාකාරී සභාව විසින් වැයකරනු ලබන්නේය.

45. (අ) සංස්ථාවේ අරමුදල සඳහා වන සියළු බැංකු ගිණුම් මත මුදල් ආපසු ගැනිම චෙක් පත් අත්සන් කිරීම අදාල සියළු ආකාරයේ ගණුදෙනු ක්‍රියාකාරී සභාවේ ප්‍රධානීගේ සහ භාණ්ඩාගාරිකගේ අත්සන් සහිතව කළයුතු වන්නේය.
(ආ) සියළුම ගෙවීම් සභාපතිගේ අනුමැතියට යටත්විය යුතුය.
(ඇ) කාර්යය මණ්ඩලයේ නඩත්තු සහ කාර්යාලය පවත්වාගෙන යැමට අවශ්‍ය වන මුදල් සංස්ථාවේ ප්‍රධාන අරමුදලින් ලබාගැනීම සභාපතිගේ අනුමැතියට යටත්ව සිදුකළ යුතුය.
(ඈ) සංස්ථාවේ මුදල් වර්ෂය සැම වර්ෂයකම ජනවාරි මස 01 සිට එම දෙසැම්බර් මස 31 දින දක්වා වේ.
(ඉ) සංස්ථාවේ විගණනය කළ වාර්ෂික අවසන් ගිණුම් වාර්ථාව භාණ්ඩාගාරික විසින් මහ සභාව වෙත ඉදිරිපත් කළ යුත්තේය.

(ඊ) සංස්ථාව විසින් කරනු ලබන මූල්‍ය කටයුතු පහසු කරනු පිණිස මූල්‍ය රෙගුලාසි සංග්‍රහයක් ක්‍රියාකාරී සභාව සකස්කර ක්‍රියාත්මක කළ යුතුය

(උ) අරමුදල් ප්‍රදානය කරන ආයතන විසින් ලබා දෙන අරමුදල් සඳහා අවශතා පරිදි වෙන වෙනම ගිණුම් ගත කිරීමට හා බැංකු ගිණුම් පවත්වා ගෙන යාමට පදනමට හැකියාව ඇත්තේය.

(ඌ) සංස්ථාවේ අවශ්‍යතාවය පරිදි විශේෂ සංචිත අරමුදල් පවත්වාගෙන යාමටත් බැංකු ගිණුම් පවත්වාගෙන යාමටත් පදනමට හැකියාව ඇත්තේය.

**නිලවරණය**

46. සංස්ථාව වාර්ෂික මහසභා රැස්වීමක් පවත්වන්නේය.

47. වාර්ෂික මහසභා රැස්වීමකදී සංස්ථාවේ සියලු ක්‍රියාකාරී සභා නියෝජිතයන් සහ අනුකමිටු සාමාජිකයන් පත්කළ යුත්තේය.

48. ක්‍රියාකාරී සභාවේ නිර්දේශය ඇතිව අනුශාසකවරුන් හා අනුග්‍රාහක භවතුන් නම්කර පත් කළ හැක්කේය.

49. සංස්ථාවේ සියලුම රීතීන් සාමාජිකයින්ගේ මහසභා රැස්වීමේදී පැමිණ සිටින සාමාජිකයින් අතරින් 2/3 කැමැත්ත මත පනවනු ලබන්නේය.

50. සංස්ථාවේ පනවන ලැබූ රීතීන් අවලංගු කිරීම, සංශෝධනය කිරීම, වෙනස් කිරීම හෝ එකතු කිරීම මහසභා රැස්වීමක දී පැමිණ සිටින සාමාජිකයින්ගෙන් 2/3 ක් හෝ වැඩි දෙනෙකුගේ ඡන්දයෙන් පමණක් සම්මත කළහැකි වන්නේය.

51. මහා සභාවේ ගණ පූර්ණය සාමාජිකයන් 1/3 විය යුතුය

52. ගරු සාමාජිකත්වය හැර සාමාජිකත්වය හිමි සෑම සාමාජිකයෙකුටම වාර්ෂික මහ සභා රැස්විමකදී එක ඡන්දයක් ප්‍රකාශ කිරීමට හිමිකම ඇත්තේය.

53. සංස්ථාවේ වාර්ෂික වාර්තාව වාර්ෂික මහ සභා රැස්වීමට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය සභාපති විසින් ඉදිරිපත් කළ යුත්තේය.

**පොදු මුද්‍රාව**

54 (අ) සංස්ථාවට පොදු මුද්‍රාවක් ඇත්තේය.

(ආ) සංස්ථාවේ පොදු මුද්‍රාව ක්‍රියාකාරී සභාවේ සාමාජිකයන් දෙදෙනෙකු ඉදිරියේ තැබීම වලංගු වන්නේය.

(ඇ) සංස්ථාවේ පොදු මුද්‍රාව සැමවිටම ක්‍රියාකාරී සභාවේ සාමාජිකයෙකු භාරයේ පවතින්නේය.

**මහ සභා රැස්වීම**

55. (අ) සංස්ථාවේ සාමාජිකයින් වර්ෂයක් තුල අවම වශයෙන් එක් වරක්වත් රැස්විය යුත්තේය.

(ආ) කාරක සභිකයින් අතරින් 1/3 කගේ ලිඛිත ඉල්ලීමක් ප්‍රධානි, ක්‍රියාකාරී සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් මහා සභා රැස්වීමක් කැඳවිය හැක්කේය.

(ඇ) i. සංස්ථාවේ මහසභා රැස්වීමක් කැඳවීමේ ලිඛිත නිවේදනය හා රැස්වීමේ න්‍යාය පත්‍රය දින හතක පූර්ව දැනුම්දීමක් සහිතව ක්‍රියාකාරී සභාව අනුමැතිය සහිතව ලේකම් විසින් සාමාජිකයන්ට යවනු ලබන්නේය.

ii. මහ සභා රැස්වීම්වල වාර්තා ක්‍රියාකාරී සභාව රැස්කර තබාගන්නේය.

iii. සංස්ථාවේ මහසභා රැස්වීමට සහභාගී වන සාමාජිකයින්ගේ අත්සන් සහිත ලේඛනයක් ක්‍රියාකාරී සභාව විසින් තබාගනු ලබන්නේය.

(ඇ) මහ ලේකම් විසින් මහා සභා වාර්ථා සකස්කළ යුතුය.

**ක්‍රියාකාරී සභාව බලතල, වගකීම් සහ විෂයපථය.**

56. සංස්ථාව වෙනුවෙන් සංස්ථාවේ අරමුණු හා අපේක්ෂාවන් ලඟාකර ගැනීම පිණිස ක්‍රියාකාරී සභාව කටයුතු කරන්නේය.

57. ක්‍රියාකාරී සභාවේ ප්‍රධානියා සංස්ථාවේ නිර්මාතෘ හා ප්‍රථම සාමාජිකයා වන්නේ ය.

58. ක්‍රියාකාරී සභාවේ ප්‍රධානියා විසින් ක්‍රියාකාරී සභාව මෙහෙය වන්නේය.

59. (අ) ක්‍රියාකාරී සභාව අවශ්‍ය සෑමවිටම රැස් වන්නේය.

(ආ) ක්‍රියාකාරී සභාවේ ප්‍රධානියා විසින් දින හතක පූර්ව දැනුම්දීමක් සහිතව ලිඛිතව ක්‍රියාකාරී සභාවේ රැස්වීමක් කැඳවීමේ දැන්වීම සහ න්‍යාය පත්‍රය ලිඛිතව ක්‍රියාකාරී සභාවේ සාමාජිකයින්ට යවනු ලබන්නේය.

(ඇ) ක්‍රියාකාරී සභා රැස්වීම්වල වාර්තා රැස්කර තබන්නේය.

60. ක්‍රියාකාරී සභාවේ ප්‍රධානියා විසින් සංස්ථාවේ ක්‍රියාකාරකම්/ විෂය කටයුතු ක්‍රියාකාරී සභාවේ ඒ ඒ සාමාජිකයාට පැවරීම, ආපසු පවරා ගැනීම, වෙනස් කිරීම, මාරුකිරීම හා ඊට අනුශාංගික වෙනත් පියවර ගන්නේය.

61. (අ) ක්‍රියාකාරී සභාව විසින් තීරණය කරන පරිදි සංස්ථාවේ අරමුණු ක්‍රියාත්මක කිරීම පිණිසත්, පරිපාලනය හා කළමනාකරණය පිණිසත්, කාර්ය මණ්ඩලයක් පත්කරනු ලබන්නේය.

(ආ) ක්‍රියාකාරී සභාව විසින් සංස්ථාවේ සාමාජිකයන් පදනමේ කාර්ය මණ්ඩලයට පත්කළ හැක්කේය.

62. සංස්ථාව විසින් ක්‍රියාත්මක කරනු ලබන සමාජසේවා ව්‍යාපෘතීන්, සමාජසේවාවන් සහ ඊට ආනුශාංගික සේවාවන් සඳහා ක්‍රියාකාරී සභාව විසින් සංස්ථාවේ අරමුදල් වැයකරනු ලබන්නේය.

63. (අ) සංස්ථාව වෙනුවෙන් අනුග්‍රාහක භවතුන් මෙන්ම අනුශාසකවරුන් පිළිගෙන සංස්ථාව සමග සම්බන්ධීකරණය කරනු ලබන්නේය.

(ආ) අනුශාසක හා අනුග්‍රාහක භවතුන්ට ගෞරව සාමාජිකත්වය ලබාදීම අවශ්‍ය වූ විට ඒ සඳහා නිර්දේශ මහසභාවට ඉදිරිපත්කළ හැක්කේය.

64. ක්‍රියාකාරී සභාව විසින් ප්‍රධාන කාර්යාලය පවත්වාගෙන යාමේ වියදම් සහ කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යාමේ වියදම් පිළිබඳව තීරණය ගනු ලබන්නේය.

65. (අ) සංස්ථාව සතු දේපල ක්‍රියාකාරී සභාව විසින් කළමනාකරණය හා පරිපාලනය කරනු ලබන්නේය.

(ආ) සංස්ථාව සතු දේපල ක්‍රියාකාරී සභාව විසින් ආරක්ෂා කරනු ලබන්නේය.

66. සංස්ථාවේ ආදායම් හා වියදම් ද, වත්කම් හා වගකීම් ද, සහ වෙනත් ගණුදෙනු වලට අදාලව නිවැරදි ගිණුම් ක්‍රියාකාරී සභාව විසින් පවත්වාගනු ලබන්නේය.

67. සංස්ථාව ආරම්භ වීමට පෙර බෝධිරාජාරාම පදනමට අදාලවන සියලුම ක්‍රියාකාරකම්, වත්කම්, සහ වගකීම් එලෙසින්ම නව සංස්ථාවේ ක්‍රියාකාරකම්, වත්කම් හා වගකීම් බවට පත්වන්නේය.

68. සංස්ථාවේ ගිණුම්, පනතේ 10 (1) (2) (3) (4) (a) (b) වගන්තිවලට අනුගතව විගණනය කළ යුත්තේය. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අනුකූල වියයුත්තේය.

69. (අ) ක්‍රියාකාරී සභාව සංස්ථාවේ ක්‍රියාකාරකම් වලට අදාලව වාර්ෂික වාර්තාවක් සකස් කළ යුත්තේය.

(ආ) එකී වාර්තාව සාමාජිකයින්ගේ වාර්ෂික මහසභා රැස්වීමට ඉදිරිපත් කළයුතු වන්නේය.

70. සංස්ථාවේ සියලුම සාමාජිකයින් සෑමවිටම මෙම රීතීන් වලට අනුගත වන්නේය.

71. මෙම රීතීන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලබන්නේය.

72. මෙම රීතීන් හා රෙගුලාසිවල භාෂා පාඨයන්හි යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතුය.

සභාපති,
බෝධිරාජාරාම අධ්‍යාපනික හා සංස්කෘතික පදනම.

07-784

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.